# බුද්ධදහමෙහි හා කිතුදහමෙහි අනන්‍යතාව : තුලනාත්මක අධ්‍යයනය සඳහා ක්‍රමවේදයක්

ශීලා ප්‍රනාන්දු

## ප්‍රවේශය

ප්‍රධාන ලෝක ආගම් දෙක වශයෙන් බුද්ධදහමෙහි හා කිතුදහමෙහි ධර්ම ග්‍රන්ථ අන්තර් අධ්‍යයනයකදී විවිධ ක්‍රම ආධුනිකයන් විසින් භාවිත කරනු ලැබේ. තුලනාත්මක ආගම් හැදෑරීමේ විෂයට (Comparative Study of Religion) අයත් මෙම ක්ෂේත්‍රය තුළ මෙහිදී ඉදිරිපත් කරනු ලබන්නේ ආගම්වල ඓතිහාසික පසුබිම් සලකමින් එම ආගම් බහු ආගමික සම්ප්‍රදා හා ලෞකික නැඹුරුතාවලින් ගහන වූ සමාජයකට සැබෑ ලෙස හඳුන්වා දෙන්නේ කෙසේද යන ක්‍රමවේදයයි. මෙසේ ඉදිරිපත් කරනු ලබන ක්‍රමවේදය වඩාත් නිවැරදි යයි මා පිළිගන්නේ එමගින් ආගම් දෙකට ද එවායේ ශාස්තෘවරුන්ට ද එවා අදහන්නන්ට ද කිසිදු ආකාරයක අසාධාරණයක් නොවන නිසාත් එක් අගයකට වඩා සත්‍යානුකූලය, විමුක්ති ජනකය යන අදහස් මගින් සමයාන්තර අධ්‍යයනය විලම්බන කිරීමට ඉඩකඩක් නොලැබෙන නිසාත් ය. මෙම ක්‍රමයට අනුව බුද්ධදහම හා කිතුදහම සම්බන්ධව ඒ ඒ ඉගැන්වීම් එවායේ ප්‍රවිශේෂ ආකෘති රටාව (paradigm) තුළ පිහිටා විග්‍රහ කර අවබෝධ කරගත යුතුයි.

ආගම් අධ්‍යයනයකදී වැදගත් වන කරුණු දෙකක් පමණක් මෙහිදී අවධානයට යොමු කෙරේ. ඒවා නම් : (i) ධාර්මික කරුණු හැකිතාක් දුරට ඒ ඒ සම්ප්‍රදා දෙකට අනන්‍යව විග්‍රහ කිරීම හා (ii) ඒ ඒ ආකෘතිය තුළ පිහිටා 'මූලිය වචන' (technical terms) තේරුම්ගැනීමය. මින් පළමු කරුණෙහිදී මූලාශ්‍රයන් (ත්‍රිපිටකය/බයිබලය) අනුගමනය කිරීම වැදගත් වන අතර සංකල්ප හැදෑරීම ආගම් දෙකෙහි ආකෘතිමය වෙනස (paradigmatic difference)